# ලංකාවේ මාධ්‍ය මර්ධනය

**ලංකා ඉතිහාසයේ පලමුවන මාධ්‍යවේදියෙකුගේ ඝාතනය, වාර්තා වූයේ ප්‍රේමදාස යුගයේදීය. ප්‍රවීණ මාධ්‍යවේදී, රිචඩ් ද සොයිසා, පැහැරගෙන යන ලද්දේ පොලිස් නිළධාරීන් විසිනි. ඔහුගේ මලකඳ සොයාග න්නා ලද්දේ මුහුදු වෙරලේ තිබීය. ඝාතනයෙන් සති කිහිපයකට පසු ඔහු රැගෙන යාමට පැමිණි පොලිස් නිලධාරියෙකු - තමා රූපවාහිනියෙන් හඳුනාගත් බව, රිචඩ් ගේ මෑනියන් වූ සරවන මුත්තු මහත්මිය සිය නීතිඥයා මාර්ගයෙන් පොලිසියට දැනුම් දුන්නේය. එහෙත් ඒ ගැන කිසිම පියවරක් නොගන්නා ලදී.**

මුල් ලිපියේ සඳහන් වූ ලියනගේ සිද්ධිය පිළිබඳව, තොරතුරක් එක් කිරීම අවශ්‍යයැයි සිතේ.

ලියනගේ සිළුමින කතු පදවියෙන් අස් කරණ ලද්දේ ඇයි ?

එ.ජා.ප. යේ බන්ඩාරනායක - කොතලාවල අර්බුදය ඇවිලෙමින් තිබුනේ මේ කාලයේය. පක්ෂයේ සතිපතා පුවත්පත් වූ "සියරට" හා "UNP journal" මුද්‍රණය කරණ ලද්දේ ලේක් හවුස් මුද්‍රණාලයයි. පක්ෂයේ ප්‍රචාරක අංශය බාරව සිටියේ කොතලාවල ඇමතිවරයාය. වරක් ඔහුගේ අධීක්ෂණය යටතේ බණ්ඩාරනායක ඇමතිවරයා විවේචනය කරමින් ලියන ලද ලිපියක් "සියරට හා UNP journal" පත්‍රවල පලකරන ලදී. මේ ගැන ආරංචිය ලැබූ වහාම පක්ෂනායක D. S. සේනානායක මහතා, පුවත්පත මුද්‍රනය කිරීම වහාම නවත්වන ලෙස නියෝග කලේය. ඒ වනවිට පත්‍රවල මුද්‍රණය ඇරඹී තිබුණි. මුද්‍රිත පිටපත් සියල්ල පුළුස්සා දමන ලෙස, නියෝගයක් නිකුත් විය. එහෙත් එම පිටපත්වලින් කිහිපයක් ලියනගේ මහතාට ලබාගත හැකි විය.

මෙයින් ප්‍රයෝජන ගත් ලියනගේ මහතා මේ බේදය පිළිබඳ ඉඟියක් සිළුමිණ පත්‍රයේ පල කලේය. මෙයින් උදහස් වූ වික්‍රමසිංහ මහතා, දඬුවම දුන්නේ ලියනගේ මහතාටය. එහෙත් ඊට ටික දිනකට පසු, බණ්ඩාරනායක ඇමතිවරයා, ආණ්ඩුවෙන් ඉල්ලා අස්වීම නිසා ලියනගේ මහතාගේ ප්‍රවෘතිය නිවැරදි භාවය ඔප්පු වීමත් සමඟ වික්‍රමසිංහ මහතාට බලවත් අපහසුතාවයක් ඇතිවිය.

මී ලඟට සැලකිය යුතු ප්‍රවෘති මර්ධනයක් ඇතිවූයේ සිරිමාවෝ බණ්ඩාරනායක රාජ්‍ය සමයේය - එය සිදුවූයේ "දවස" පුවත්පත් ආයතනයට සීල් තැබීමෙනි.

එම සීල් තැබීම හා වෙනත් කාරණා උඩ උද්ගතවූ දේශපාලන ආන්දෝලනය නිසා නොවේනම්, සිරිමා බණ්ඩාරනායක රාජ්‍ය (පැරදුනත්) අන්ත පරාජයක් නොලබන්නට තිබුණි.

පුවත්පත් නිදහසට බාධා කිරීම මැතිවරණ වේදිකාවේ ප්‍රධාන තුරුම්පුව වශයෙන් භාවිතාකළ එ.ජා.ප.ය බලයට පත්වූ පසු, ලේක්හවුසිය රාජ්‍යපාලනයෙන් ඉවත් කරණු ඇතැයි ජනතාවගේ බලාපොරොත්තුව විය. එයින් සිදුවූයේ කුමක්ද ?

බලයට පැමිණ සතිකිහිපයක් ඇතුළත ලේක්හවුසිය රජයේ පාලනයෙන් බවත් කිරීම වෙනුවට ජයවර්ධන රජය කලේ ටෛම්ස් ආයතනයත් රජයට පවරා ගැනීමයි. ඉන්පසු, මාධ්‍ය පාලනය සම්පූර්ණයෙන්ම පාහේ රජයට පැවරුනේය.

හැරල්ඩ් පීරිස් හා පිලිප් කුරේ

77 ආණ්ඩුව පිහිටවා ටික කලකට පසු ඔබ්සවර් පත්‍රයේ ඡායාරූප දෙකක් පලවිය. එකක් විදේශ ඇමති හමීඩ් තවත් තානාපතිවරයෙකු සමඟ කතාබහ කෙරුණු ඡායාරූපයකි. අනෙක, දිය කෙලියේ යෙදෙන තරුණ යුරෝපීය ජෝඩුවක ඡායාරූපයකි. අත්වැරදීමකින් මේ පින්තූර දෙක හඳුන්වන "කැප්ෂන්" මාරුවීම නිසා පත්‍රයේ දෙවන මුද්‍රණයෙන් එය නිවැරදිකොට සමාව ඉල්වීමට සිදුවිය.

මේ ඉතා සුළු සිද්ධියෙන් ඉමහත් ප්‍රයෝජනයක් ලබාගත හැකියැ'යි සිතූ, රජය ඊට ටික දිනකට පෙර සම්මත කරගන්නා ලද නීතියක් අනුව පත්‍රයේ කතෘ හැරල්ඩ් පීරිස් සහ නියෝජ්‍ය කතෘ පිලිප් කුරේ ද, පාර්ලිමේන්තු සභා ඝර්භයට කැඳවා මුළු පාර්ලිමේන්තුවම විනිශ්චය මණ්ඩලයක් සේ ක්‍රියා කරමින් මන්ත්‍රී වරයෙකුට අපහාස කිරීමේ චෝදනව විභාග කරන ලදී. කතෘවරු ඊට සමාව අයැද සිටියද, ඔවුන් දෙදෙනාටම රු. 5000/= බැගින් දඩ නියම කල යුතුයැයි කියමින් කතාකල, විපක්ෂ නායක අමිර්තලිංගම් මහතා මෙසේ පැවසීය.

"අපි විනිශ්චය කාරයන් වන අතර සානුකම්පිකද විය යුතුය. සුළු දඩයක් පමණක් සෑහේයැයි මම සිතමි."

ඒ ගැන අදහස් පලකල අගමැති ජයවර්ධන මහතා මෙසේ පැවසුවේය.

"නැහැ...... මේ සිද්ධිය, පුවත්පත්වලට පූර්වාදර්ශයක් විය යුතුයි. මෙම එක්සත් ප්‍රවෘතිපත්‍ර සමාගමේ, කොටස් හිමියෙක්. අගමැතිවරයා වශයෙන් නොව, සමාගමේ කොටස් හිමියෙකු වශයෙන්, මම ඒ සමාග මෙන් ඉල්ලා සිටිනවා. මේ දඩමුදල, සමාග මෙන්ම ගෙවන ලෙස."

(මේ සම්පූර්ණ "විකට ජවනිකාව" හැන්සාඩ් වාර්තා ගතය.)

රිචඩ් ද සොයිසා

ලංකා ඉතිහාසයේ පලමුවන මාධ්‍යවේදියෙකුගේ ඝාතනය, වාර්තා වූයේ ප්‍රේමදාස යුගයේදීය. ප්‍රවීණ මාධ්‍යවේදී, රිචඩ් ද සොයිසා, පැහැරගෙන යන ලද්දේ පොලිස් නිළධාරීන් විසිනි. ඔහුගේ මලකඳ සොයාගන්නා ලද්දේ මුහුදු වෙරලේ තිබීය. ඝාතනයෙන් සති කිහිපයකට පසු ඔහු රැගෙන යාමට පැමිණි පොලිස් නිලධාරියෙකු - තමා රූපවාහිනියෙන් හඳුනාගත් බව, රිචඩ් ගේ මෑනියන් වූ සරවන මුත්තු මහත්මිය සිය නීතිඥයා මාර්ගයෙන් පොලිසියට දැනුම් දුන්නේය. එහෙත් ඒ ගැන කිසිම පියවරක් නොගන්නා ලදී. 1993 හෝ 1994 ජේ සිඩ්නි නුවරට පැමිණ දේශනා කිහිපයක් පැවැත් වූ සරවන මුත්තු මහත්මිය ඉහත කී පොලිස් නිලධාරියා 1993 මැයි පලවෙනිදා බෝම්බයකට අසුවී මිය ගිය බව ප්‍රකාශ කලාය.

පසු කාලයක, මාධ්‍ය වේදීන් සඳහා බත්තරමුල්ල ප්‍රදේශයේ ඉදිකරන ලද නිවාස යෝජනා ක්‍රමයක්, " රිචඩ් ද සොයිසා නිවාස යෝජනා ක්‍රමය" යනුවෙන් නම් කරන ලදී.

මාධ්‍ය විකෘතිය, මාධ්‍ය මර්ධනය හා ඝාතනය, පිළිබඳව, සමකාලින ඉතිහාසයේ පරිනාමයෙන් බිඳක් පමණි මේ ලිපි දෙකේ අඩංගු වූයේ.



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්

එස්. පියසේන



# සිනුවර හසුන

## සිඩ්නි සිට ලියමි

ස්වභාව ධර්මය මගින් ක්‍රියාත්මක කරණු ලබන බොහෝ දේ සිදුවන්නේ එක්තරා රටාවකටය, ලතාවකටය.

ඒ දිනවල, උදේ හයට පමණ කන්ද උඩින් හිරු පායන අයුරු දුටු හැටි මගේ මතකයේ සඳ රැඳී පවතී. එලෙසම හවස හයට පමණ හිරු මුහුදේ ගිලී යන අයුරු දුටු හැටිත් මගේ මතකයේ ඇත. "කොවුලා වෙණ තත දස අත වයමින් පෙම් පණිවිඩය පතුරණ" කාලයේ, "නෙත ගිය හැම තැන දළුමල් අබරණ" මවමින් මාර්තු අප්‍රියෙල් වසන්ත සමය උදාවිය. "අප උද්‍යානේ සීතා සැපා දුන් එම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ" උදාවුනේ සැප්තැම්බරයේ ය. "සීතල කරයි උදුවප් මහ දුරුත්තේ" කියා කියවුනේ "සීතලට අපට දුරුතු සිහින" පෙනෙන කාලය ගැනයි.

මේ සියළු විස්තර, එදා මා සිටි ශ්‍රී ලංකාවේ අත්දැකීම් බව අමුතුවෙන් කිව යුතු නැත. වැඩි විස්තර සහිතව කිවහොත් ඒ උතුරු අර්ධ ගෝලයේ, සමකයේ සිට අක්ෂාංෂක කිහිපයක් පමණක් උතුරෙන් පිහිටි ශ්‍රී ලංකාවේ දී ය. ශ්‍රී ලංකාවේත් බටහිර දිශාවේ දී ය.

අද අප සිටින්නේ දකුණු අර්ධගෝලයේ පිහිටි "ඩවුන් අන්ඩර්" නොහොත් සිංහලෙන් "දකුණු කුරු දිවයින" යැයි මා හඳුන්වන ඕස්ට්‍රේලියාවේ ය. එහි ද නැගෙනහිර මුහුදු වෙරල අසලය.

එදා මෙන්ම අද ද, මම හිරු නැග එනවා දකිමි. මේ වෙනත් සූර්ය රාජයෙකු නොව, එදා ශ්‍රී ලංකාවේ දී දුටු සූර්යයා ම ය. එදා, අරුමයකි. හිරු පායා එන්නේ එදා දුටු පරිදි කන්ද උඩින් නොව, පැසිෆික් මුහුදෙන් මතුවී ය. ඒ විපරියාසය තවත් වැඩි කරමින් හෙතෙම, සවස් කාලයේ එදා අප දුටූ පරිදි මහ මුහුදේ ගිලී නොව, බටහිර දිග තුමුල නුබ කුස වසා සිටින නිල් කඳු වැටිය අතරේ සැඟවී බැස යයි.

ඒ සමගම, සූර්ය දිව්‍ය රාජයාණෝ, මනෝභාව දෝලන ව්‍යාධියකින් පෙළෙන බැවින්දෝ කාලයෙන් කාලයට තම කාල සටහන වෙනස් කරති. වසර මුලදී කඩියෙකු මෙන් කඩිසර හෙතෙම, උදෑසන හයටත් පෙර අවදි වෙයි. රාත්‍රී හත අට වන තුරු විඩා හැරීමට නොසිතයි. එහෙත් වසර මැද වන විට හෙතෙම කෙතරම් අලස වෙනවාද කිවහොත් උදෑසන හත වන විට ද නිදිගැට කඩයි. යාන්තම් හවස පහ වෙන විට ඈනුම් අරිමින් යලි නින්දට සැරසෙයි.

එදා මා එකම රටාවකට, එකම ලතාවකට සිදුවෙනවා යැයි සිතා සිටි ස්වභාවධර්මායානුකූල සංසිද්ධීන්, අද තව දුරටත් එදා ලෙස සිදු නොවෙන බව මෙයින් පෙනේ.

එදා සීතල දුරුත්ත වෙනුවට අද ඇත්තේ ගත දබිඳු නගනා, සරතැස මවනා, මෙලනෝමා සඳනා, ග්‍රීස්මයකි. සරුංගල් සුලං හැමූ, වියලි අගෝස්තුව වෙනුවට අද ඇත්තේ ඇස්කිමෝ පරිසරයකි.

මේ සේරටමත් වඩා ඇති වෙනස නම්, එදා දළු, කොල, මල් පිරුණු හරිත වසන්තය වෙනුවට බක් මාසයේ ඇත්තේ, ගස් කොල ගැලවී හැලෙන, මල් මැලවෙන හේමන්තයකි.

බක් නව සඳ සමග ඇරඹී වෙසක් නව සඳ සමග අවසන් වෙන බක් මාසයේ සිනුවර පැවැත්වෙන මහ උළෙල දෙකකි. ඉන් පළමුවැන්න නම් සිංහල අළුත් අවුරුද්ද සැමරීම සඳහා සිනුවර පැවැත්වෙන අළුත් අවුරුදු උත්සවයයි. සිංහල අළුත් අවුරුද්දේ එක් ප්‍රධාන තේමාවක් ද වන සමගිය සහ එකමුතු කම ප්‍රායෝගිකව විදහා දක්වමින් මෙම උත්සවය සංවිධානය කෙරෙනුයේ සිනුවර පවතින විවිධ ප්‍රජා සංවිධාන රැසක සහභාගීත්වයෙනි.

පෙර සඳහන් දෙවැනි උළෙල නම්, දැන් සාර්ථක විසිවැනි වසරට එලෙඹෙමින් සිටින නව දකුණු වේල්සයේ සංස්ථාපිත "සිංහල සංස්කෘතික හමුව" විසින් කාලයක් තිස්සේ සංවිධානය කරණු ලබන "බක් මහ රංගන" නම් වූ මහා කලා මංගල්‍යයයි. සිනුවර වෙසෙන කුසලතා පූර්ණ කලාකරුවන් ගේ දස්කම් ද, අපේ අනාගත පරපුරේ දෙපෙත්තේ දස්කම් ද, ශ්‍රී ලංකාවේ සිට පැමිණෙන ආරාධිත ශිල්පීන් ගේ ඉදිරිපත් කිරීම් ද එකම වේදිකාවක දිග හැරෙන බක් මහ රංගන ප්‍රසංගය මෙවර මැයි මස දෙවන සෙනසුරාදා සවස හිල්ස් මධ්‍යස්ථාන සුවිසල් කලාගාරයේ දී පැවැත්වීමට නියමිතය. මෙවර බක් මහ රංගනයට ආරාධිත ශිල්පීන් ලෙස සහභාගීවන්නේ ප්‍රතිභාපූර්ණ රංගන ශිල්පී කමල් අද්දරආරච්චි සහ මෙල්බර්න් නුවර වාසීන්ට නම් අමුත්තියක් නොවන යසෝදරා සරච්චන්ද්‍ර ලියනාරච්චිය.

මා මේ සටහනේ මුලින් සඳහන් කළ අයුරින්, උතුරු අර්ධ ගෝලයේ ලංකාද්වීපයේ සිට දකුණු කුරු දිවයිනට පැමිණි අප, එදා අප දුටු ස්වභාවධර්මාණුකූල රටාවන් අද වෙනස් වී ඇති අයුරු දැක වික්ෂිප්ත වූ සිතින් යුතුව ඉන්නා නිසාදෝ තවමත් දේසේ හැටියට බාසේ වෙනස් කරගෙන නැතුවා සේය. හේමන්තයේ පැවත්වෙන බක් මහ රංගන ප්‍රසංගය "වසත් රාව" ලෙස විඥාණකව නම් කර ඇත්තේ ඒ නිසා විය යුතු යැයි මට සිතේ.

"වසන්තේ නිදාවුන් සිනුවර කොවුල් කෝකිලාවියන්, මයුර මයුරියන් මේ හේමන්තයේ දී සුමධුර ගී ගයත්වා! මනරම් රැඟුම් රඟත්වා!" යැයි මම ඉත සිතින් යුතුව පතමි.

ලබන මාසයේ නැවත හමුවෙමු.

සිනුවර ආරච්චිල
<sinuwara.arachchila@gmail.com>